# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශය

## ජපානයේ රැකියා අවස්ථා සඳහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් යොමු කිරීමේ වැඩසටහනට අදාලව දැනුවත් කිරීමේ වැඩසටහන

විදේශ රැකියා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ IM Japan ආයතනය (International Manpower Development Organization) සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව ජපානයේ රැකියා අවස්ථා සඳහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් යොමු කිරීමේ වැඩසටහන මේ වන විට ආරම්භ කර ඇති අතර මේ සඳහා කිසිදු අයකිරීමක් නොමැත.

ඒ අනුව ප්‍රධාන වශයෙන් සාත්තු සේවිකා (කාන්තා) රැකියා කාණ්ඩය සඳහා රැකියා අවස්ථා පවතින අතර ඒ සඳහා බඳවාගැනීමේදී පහත මූලික සුදුසුකම් සපුරාලීම අනිවාර්යය වේ.

- ජපන් භාෂා ප්‍රවීණතාව JLPT 4 හෝ NAT 4 සමත් වීම හෝ ඊට ඉහල සුදුසුකම්.
- ශරීරයේ Tattoo නොතිබිය යුතුය.
- අයදුම් කිරීමේදී වයස අවු. 18 – 30 අතර විය යුතුය.
- අපොස උ/පෙළ විභාගය සඳහා පෙනී සිටි අය විය යුතුය.
- උස 150cm හෝ ඊට වැඩි විය යුතුය.

**මෙම රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පහත පරිදි කාර්යාංශ අලෙවිකරණ හා බඳවාගැනීම් (සාමාන්‍ය) අංශය මඟින් සංවිධානය කර ඇති අතර ඔබ දැනට ජපන්භාෂාව හදාරණ, N5 හෝ ඊට ඉහල සුදුසුකම් සපුරා ඇති අයෙකු නම් ඒ සඳහා සහභාගී වීමට ඔබටත් අවස්ථාව ඇති අතර සහභාගී වීමට අපේක්ෂා කරන්නේ නම් 2018.07.09 දිනට පෙර දුරකතන අංක 011 2791814 හෝ 011 4388294 වෙත ඔබගේ සහභාගීත්වය තහවුරු කර ලියාපදිංචි වන ලෙස මෙයින් දන්වා සිටිමු.**

| ඉලක්කගත දිස්ත්‍රික්කය | වැඩසටහන පැවැත්වෙන දිනය | වැඩසටහන පැවැත්වෙන ස්ථානය |
|---|---|---|
| කොළඹ | 2018.07.11 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවණාගාරය |
| ගම්පහ | 2018.07.12 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවණාගාරය |

වැඩි විස්තර සඳහා,

*කළමණාකරු - අලෙවිකරණ හා බඳවාගැනීම් (සාමාන්‍ය) අංශය*

*දු.අංක - 011 2791814, 011 4388294*